ජාතික අයවැය චක්‍රලේඛ අංක: **03/2016**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම සඳහා වන උපදෙස්**

හදිසි ආපදා තත්ත්වයකදී ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම අරමුණු කොට ගෙන නිකුත් කරන මෙම චක්‍රලේඛය 2017.01.01 දින සිට බලපැවැත්වෙන අතර, මුදල් අමාත්‍යාංශය විසින් මෙයට අදාලව මීට පෙර නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 152(I), 152(II) හා 152(III) මෙයින් අවලංගු කරනු ලැබේ.

**02.** හදිසි ආපදා තත්ත්වයකදී ආපදා අවදානම අවම කිරීම සඳහා සියළු ජනතාව ආවරණය වන පරිදි රක්ෂණ ආවරණයක් ලබාදීමට රජය විසින් පියවර ගෙන ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල විසින් මෙම චක්‍රලේඛයේ 03 වන ඡේදයේ සඳහන් ආපදා තත්ත්වයන් හේතුවෙන් අවතැන් වන, නිවාස අහිමි වන සහ ජීවිතක්ෂයට පත්වන පුද්ලයන් සඳහා සහන සැලසීමට ක්‍රියා කරනු ලැබේ. මෙම රක්ෂණ ආවරණ ක්‍රමය දැනටමත් ක්‍රියාත්මක වන බැවින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශ ආවරණය වන පරිදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතන වන ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සම්බන්ධීකරණය කරගනිමින් හදිසි ආපදා තත්ත්වයන්හිදී සහන සැලසීමට ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

**03. ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයෙන් ආවරණය වන හානි:**

ගංවතුර, සුළිසුළං, නාය යෑම්, කුණාටු, චණ්ඩ මාරුත, සැඩ කුණාටු, භූමිකම්පා, සුනාමි, අකුණු සැර, අනපේක්ෂිතව යම් දෙයක් වැටීම, තද සුළඟ නිසා ගස් කඩා වැටීම, වර්ෂාවෙන් තාප්ප කඩා

වැටීම සහ ඊට සමාන වෙනත් ස්වාභාවික ආපදා හේතුකොට ගෙන සිදුවන සියලුම ජීවිත හා දේපල හානි.

### 03.1 රක්ෂණාවරණය මගින් සලසන සහන හා ප්‍රතිලාභ:

**(i) ජීවිත හානි:**

ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන ජීවිත හානි සඳහා පුද්ගලයෙකු වෙනුවෙන් රු.100,000/- ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට ක්‍රියා කරනු ලැබේ.

**(ii) පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වීම:**

මෙම රක්ෂණ ක්‍රමයෙන් ආවරණය වන ස්වාභාවික ආපදා හේතුවෙන් ඇති වන පූර්ණ අකර්මණ්‍යතා හා සදාකාලික ආබාධිත තත්වයට පත්වූවන් සඳහා පුද්ගලයෙකු වෙනුවෙන් රු.100,000/- ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට ක්‍රියා කරනු ලැබේ.

**(iii) දේපළ හා නිවාස හානි:**

ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන දේපළ හා නිවාස හානි වෙනුවෙන් එක් පවුලකට රුපියල් ලක්ෂ 25 ක උපරිමයකට යටත්ව වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන අතර, වාර්ෂික පිරිවැටුම රු.මිලියන 10 ට අඩු ව්‍යාපාරයන්ටද මෙම සහනය හිමිවේ.

දේපළ හානි වෙන වෙනම ගණනය කොට ප්‍රතිලාභී සීමාව තුල ගෙවීම් කල යුතුය.

**(iv) ක්ෂණික ආපදා සහන / පිසූ ආහාර:**

සියලුම දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම සඳහා මෙන්ම, හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම හා ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම සඳහා සහන සැලසීම වෙනුවෙන් ක්‍රියා කළයුතුය.

ඒ අනුව, ආපදා තත්ත්වයක දී ආපදාවට ලක් වූ පුද්ගලයන් ස්ථිර පදිංචි ස්ථානවලින් ඉවත් කර තාවකාලික රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා ඇති විට එම සියලුදෙනාටම ආදායම් මට්ටම නොසලකා පිසූ ආහාර සැපයිය යුතුය. ඒ අනුව, එක් පුද්ගලයෙකු වෙනුවෙන් දිනකට රු.225/- ක උපරිමයකට යටත්ව වියදම් දැරිය හැකිය.

ප්‍රාදේශීය ලේකම්වරයාට සිය අභිමතය පරිදි දින 03 ක උපරිමයක් දක්වා පිසූ ආහාර ලබාදීමට හැකි අතර, එතැන් සිට ඉදිරියට දින 4 ක් දිසාපති/දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත ලබාදිය හැක. එතැන් සිට ඉදිරියට තවත් දින 7 ක කාලයක් දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විමසා අදාළ අනුමැතිය ලබාගත යුතුය.

**(v) වියළි ආහාර ලබාදීම:**

වියළි සලාක ලබා දීමේ අවස්ථාව එළඹී වහාම අවශ්‍යතාවය අනුව වියළි සලාක ලබා දීම ආරම්භ කල යුතුය. ආපදා තත්ත්වය යටතේ සුභ සාධන මධ්‍යස්ථාන වල සිටින පවුල් සහ සුභ සාධන මධ්‍යස්ථාන වලට නොපැමිණි තම නිවසේ හෝ ඥාතීන්ගේ නිවෙස්වල සිටින පවුල් සඳහා ද, පිසූ ආහාර ලබා දෙන කාල පරාසයට සමාන කාල පරාසයකට වියළි සලාක ලබා දිය යුතුය.

වියළි සලාක වෙනුවෙන් සතියකට වැය කල හැකි උපරිම මුදල

| | රුපියල් |
|---|---|
| තනි පුද්ගලයෙකු සඳහා | 700 |
| සාමාජිකයින් 02 යුත් පවුලකට | 900 |
| සාමාජිකයින් 03 යුත් පවුලකට | 1,100 |
| සාමාජිකයින් 04 යුත් පවුලකට | 1,300 |
| සාමාජිකයින් 05 යුත් පවුලකට | 1,500 |

වියළි සලාක ලබා දීම සඳහා විවිධ සේවා සමුපකාර සහ සතොස අලෙවිසැල් වලින් සෘජුව ද, එයට අමතරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ මිල ගණන් කැඳවා බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිලදී ගැනීම සිදු කල හැකිය.

**03.2 මෙම රක්ෂණාවරණය යටතේ පහසුකම් සැලසීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය:**

**(i)** හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත්වූවන් සඳහා මෙන්ම, ආපදා අවදානම් තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් අවතැන් වන පුද්ගලයින් සඳහා ද, ඉතා කඩිනමින් සහන සැලසීමට ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සම්බන්ධීකරණය කිරීමෙන් අවශ්‍ය පියවර ගතයුතුය.

**(ii)** සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ආපදා තත්ත්වය ඇතිවීමත් සමග අවශ්‍ය කරන අත්තිකාරම් මුදල් කඩිනමින් ලබාගැනීම සඳහා ආපදා තත්ත්වය පිළිබඳව හා අවශ්‍ය කරන අත්තිකාරම් මුදල පිළිබඳව වූ තොරතුරු දිස්ත්‍රික් ලේකම් / දිසාපති මඟින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය. එසේම, සියලු ආපදා තත්ත්වයන් කළමනාකරණය කර ගැනීමට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සමග සම්බන්ධීකරණය වෙමින් දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කළයුතුය.

**(iii)** ආපදා තත්ත්වය පාලනය කර ගැනීමත් සමඟ ආපදාව මඟින් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාල සියලු විස්තර ආපදාව සිදු වී මාස 02ක් ඇතුළත (තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර) අදාළ ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් සිය දිස්ත්‍රික් ලේකම් මඟින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට එවීමට ක්‍රියා කළ යුතු අතර ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් එම විස්තර ජාතික රක්ෂණභාර අරමුදලට යවා ප්‍රතිපූර්ණය කිරීමට වග බලා ගත යුතුය.

**04. රක්ෂණාවරණයෙන් ආවරණය නොවන පහත සඳහන් ආපදා තත්ත්වයන් වෙනුවෙන් අවශ්‍ය සහන සැලසීම:**

රක්ෂණාවරණය යටතේ ආවරණය නොවන නියඟය සඳහා අවශ්‍ය සහන සැලසීමට එම ආපදාව පිලිබඳ විස්තර අදාළ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සිය දිස්ත්‍රික් ලේකම්වරයා හරහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කල යුතුය. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් එම ඉල්ලීම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ මහා භාණ්ඩාගාරය වෙත යොමු කල පසු අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ.

හදිසි නියං තත්ත්වයක් තුල පානීය ජලය සපයා දීම සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට ලබාදීමට ක්‍රියාකරනු ලැබේ. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම්වරුන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විමසා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරගත යුතුය.

**05. ප්‍රතිසංස්කරණ කටයුතු:**

**05.1 සුළු පරිමාණ ප්‍රතිසංස්කරණ කටයුතු:**

හදිසි ආපදා තත්ත්වයක් තුළ හානියට පත් සුළු පරිමාණයේ ග්‍රාමීය මාර්ග, කුඩා වැව්, අමුණු, පාලම් වැනි ග්‍රාමීය යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම අදාල දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කල යුතුය. සිදු වූ හානිය ඇස්තමේන්තු කිරීමෙන් පසු අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමෙන් අනතුරුව එම කටයුතු කඩිනමින් නිම කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් පියවර ගත යුතුය.

**05.2 මහා පරිමාණයේ ප්‍රතිසංස්කරණ කටයුතු:**

හදිසි ආපදා තත්ත්වයකදී දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල හානියට පත්වන මහා පරිමාණයේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමේ වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශයන්ට පැවරේ. මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමට යන වියදම ඇස්තමේන්තු කොට, පවත්නා ප්‍රතිපාදන තුළින් හෝ අවශ්‍ය වේ නම් මහා භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව එම කටයුතු අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කල යුතුය.

**06.** මෙම චක්‍රලේඛය පිළිබඳව යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ( දුරකතන අංක 011 – 2484665 ) විමසිය යුතුය.

**ආර්.එච්.එස්.සමරතුංග**
**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්
05. ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්
06. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්
07. පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්
08. ජාතික රක්ෂණභාර අරමුදලේ සභාපති
09. විගණකාධිපති

(05–08: අදාළ වන පරිදි නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කිරීම සඳහා)

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/RDS/106/07/04
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 30.12.2016

**National Budget Circular No. 03/2016**

To All Secretaries to the Ministries
Heads of Departments
All District Secretaries / Government Agents
All Divisional Secretaries

**Guidelines to Provide of Relief to the Disaster Victims in a Disaster Emergency situation and to the People Evacuated from the Residencies due to Disaster Risk; and Restoration of Damaged Areas.**

The Circular, issued with the instructions to provide relief to the People who are affected by a Disaster Emergency Situation and Restoration of Damaged Areas, will be effective from 01.01.2017. The National Budget Circulars No. 152 (I), 152 (II) and 152 (III), issued for the same purpose by the Ministry of Finance are hereby repealed.

**02.** The government has taken actions to provide an insurance, covering all the Public in order to mitigate disaster risk in a disaster emergency situation. Accordingly, National Insurance Trust Fund will provide relief to persons who are displaced, lost their houses and lives due to disaster situation as stipulated in paragraph 03 of this circular. Since this insurance coverage has already been implemented, Divisional Secretaries and District Secretaries should take necessary actions to provide relief in a disaster emergency situation in co – ordination with the Ministry of Disaster Management, and the Disaster Relief Centre and District Disaster Management Units functioning under the said Ministry, covering areas belonging to District Secretariats or Divisional Secretariats.

**03. Damages covered by the National Natural Disaster Insurance Scheme**:

All the Damages caused lives and properties due to Cyclone, Storm, Tempest, Flood, Landslide, Hurricane, Earthquake, Tsunami or victims of Lightning, Falling Object, Falling of trees by heavy wind, collapse of retaining wall induced by rain, or any other Natural Perils.

### 03.1 Relief and benefits provided by the Insurance Coverage:

#### (i) Loss of Life:

A maximum compensation of Rs.100,000 will be paid for a person who died due to a natural disaster.

#### (ii) Fully handicapped situation:

A maximum compensation of Rs.100,000 will be paid for persons who have become totally inactive and disabled lifelong due to natural Disasters, under this insurance coverage.

#### (iii) Damages to property and houses:

A compensation, subjected to a maximum amount of rupees 2.5 million will be paid for a family, whose property and houses were damaged due to natural disasters. Businesses with annual turnover is less than rupees 10 million are also eligible for this compensation.

Property damages should be calculated separately and payments should be made within the limits of benefits.

#### (iv) Instant disaster relief/ cooked meals:

All the Government Agents / District Secretaries and Divisional Secretaries should take actions to provide relief to public evacuated from their residences due to disaster emergency situation and to restore damaged areas and normal life.

In case of a disaster situation, cooked meals should be provided to all who stay in temporary welfare centers away from their residences irrespective of their income level. Accordingly, expenditure may be incurred subject to the limit of Rs.225/- per person per day.

As per his / her discretion Divisional Secretary can provide cooked meals for maximum of 03 days. On the approval of the Government Agent / District Secretary, cooked meals can be provided for another 4 days from that date. If it is required to extend such period beyond 7 days. The approval should be obtained from the Secretary, Ministry of Disaster Management.

#### (v) Provision of Dry Rations

When the need arises, dry rations should be supplied immediately as per the requirement. Dry ration should be provided for an equal period of time provide cooked meals in respect of families staying at their homes or house of their relatives without coming to welfare centers and families staying in temporary welfare centers due to disaster situation.

**Maximum amount payable for dry rations per week**

| | Rupees |
|---|---|
| For a Single Person | 700 |
| A Family with 02 Members | 900 |
| A Family with 03 Members | 1,100 |
| A Family with 04 Members | 1,300 |
| A Family with 05 Members or more | 1,500 |

Dry rations may be purchased directly from multipurpose co – operative shops, and / or sathosa outlets and / or in addition, through external suppliers calling quotations as per procurement guidelines.

**03.2 Procedure to be followed to provide facilities under this insurance coverage:**

**(i)** Required actions should be taken by Divisional Secretaries / District Secretaries coordinating with the Ministry of Disaster management and Institutions under the purview of said Ministry to provide immediate relief for disaster victims and persons displaced due to disaster risk situation.

**(ii)** With the emergence of disaster situation, all Divisional Secretaries should inform the details of disaster situation and required amount of advance money to the Secretary to the Ministry of Disaster Management through the District Secretary/ Government Agent. Further District Secretaries should take actions to manage the disaster situation coordinating with District Disaster Management Units.

**(iii)** Having managed the disaster situation, relevant Divisional Secretaries should take actions to send all the relevant details (assessment reports and other details) to the Ministry of Disaster Management through his District Secretary within 02 months from the disaster to reimburse. The Ministry of Disaster Management should forward the said details to the National Insurance Trust Fund to reimburse the same.

**04. Provision of necessary relief for the following disaster situation which is not covered by the insurance scheme:**

Details of drought, which is not covered by this insurance should be referred to the Secretary to the Ministry of Disaster Management by relevant Divisional Secretary through his / her District Secretary for the provision of required relief. Having referred the said request to the General Treasury along with recommendation of the Secretary to the Ministry of Disaster Management, necessary provisions will be allocated by General Treasury. In an emergency drought situation General Treasury will take actions to provide required amount of funds to the Ministry of Disaster management for the supply of drinking water. Accordingly, District Secretaries should contact the Secretary, Ministry of Disaster Management and coordinate required actions.

**05. Reconstruction Activities:**

**05.1 Small Scale Reconstruction Activities:**

Relevant District Secretaries should take actions to reconstruct rural infrastructure facilities such as small scale rural roads, small tanks, anicuts, bridges damaged due to disaster situation.

An estimation of damage caused by the disaster and after receiving required additional provisions from the General Treasury, District Secretaries should take actions to complete such work immediately.

**05.2 Large Scale Reconstruction Activities:**

The responsibility of reconstruction of large scale infrastructure facilities damaged in different districts of the country in an emergency situation shall be with the relevant line Ministries. After estimation of the cost for the reconstruction of damaged infrastructure facilities in each district, the relevant line Ministry should use the existing provisions or additional provisions obtained from the General Treasury if necessary.

**06.** If any clarification on this circular is required, the Director General, Department of National Budget should be contacted (Telephone – 011- 2484665).

**Sgd/R.H.S.Samaratunga**
**Secretary to the Treasury**

Copies:

01. Secretary to the President
02. Secretary to the Prime Minister
03. Secretary to the Cabinet of Ministers
04. Secretary to the Ministry of Home Affairs
05. Secretary to the Ministry of Disaster Management
06. Secretary to the Ministry of Health, Nutrition and Indigenous Medicine
07. Secretary to the Ministry of Provincial Council and Local Government

(Items 03–07:) To issue instructions to the relevant officers

08. Chairman, National Insurance Trust Fund
09. Auditor General

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/RDS/106/07/04
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.05.30

வரவு செலவுத்திட்ட சுற்றுநிருப இல.03/2016 (i)

அமைச்சுக்களின் செயலாளர்கள், திணைக்களத் தலைவர்கள்,
மாவட்டச் செயலாளர்கள் / அரசாங்க அதிபர்கள்,
பிரதேச செயலாளர்கள் அனைவருக்கும்

**அனர்த்த அவசர நிலைமைகளில் பாதிக்கப்பட்டவர்களுக்கும் அனர்த்த ஆபத்துக்களினால் வதிவிடங்களிலிருந்து அகற்றப்பட்ட மக்களுக்கான நிவாரணம் வழங்குதல் மற்றும் சேதமடைந்த பிரதேசங்களை மீள் கட்டியெழுப்புதல் என்பவற்றுக்கான வழிகாட்டல்**

மேற்குறித்த விடயம் தொடர்பாக தேசிய வரவு செலவுத்திட்டத் திணைக்களத்தினால் விநியோகிக்கப்பட்ட 2016.12.30 ஆந் திகதிய 03/2016 ஆம் இலக்க சுற்றுநிருபத்தின் 03–01 இன் (iv) மற்றும் (v) பந்திகளின்பால் உங்களது கவனம் ஈர்க்கப்படுகின்றது.

2. இதற்கமைவாக, தற்பொழுது காணப்படும் அவசர நிலைமை மற்றும் அனர்த்தத்தினால் பாதிக்கப்பட்ட மக்களுக்கு அவசர நிவாரணம் வழங்குவதனை கவனத்திற் கொண்டு சமைத்த உணவு மற்றும் உலர் நிவாரணங்களை அவசர உதவி நிவாரணமாக வழங்குவதற்கான ஆகக் கூடிய வரையறை இத்தால் திருத்தப்படுகின்றது.

| விடயம் | 03/2016 சுற்றுநிருபத்தின்படி தற்பொழுது காணப்படும் வரையறை (ரூபா) | | திருத்தப்பட்ட உயர் எல்லை |
|---|---|---|---|
| அவசர அனர்த்த நிவாரணம் / சமைத்த உணவு (ஒரு நாளைக்கு) | சமைத்த உணவு (தினசரி ஆளொருவருக்கு) | 225 | 300 |
| உலர் நிவாரணங்களுக்கான ஏற்பாடு (வாரமொன்றுக்கு) | ஆளொருவருக்கு | 700 | 900 |
| | 02 பேரைக்கொண்ட குடும்பம் | 900 | 1,200 |
| | 03 பேரைக்கொண்ட குடும்பம் | 1,100 | 1,400 |
| | 04 பேரைக்கொண்ட குடும்பம் | 1,300 | 1,600 |
| | 05 பேரைக்கொண்ட குடும்பம் | 1,500 | 1,800 |

இதற்கமைவாக அனர்த்த நிவாரணங்களை வழங்கும் போது புதிய வரையறைகளை பின்பற்றுமாறு நீங்கள் கேட்டுக் கொள்ளப்படுகின்றீர்கள்.

3. வரவு செலவுத்திட்ட சுற்றுநிருப இல. 3/2016 இன் ஏனைய ஏற்பாடுகள் எவ்வித மாற்றமுமின்றி காணப்படும்.

**ஒப்பம்/ ஆர்.எச்.எஸ்.சமரதுங்க**
**திறைசேரியின் செயலாளர்**

பிரதிகள் :

1. சனாதிபதியின் செயலாளர்
2. பிரதமரின் செயலாளர்
3. அமைச்சரவையின் செயலாளர்
4. உள்நாட்டு அலுவல்கள் அமைச்சின் செயலாளர்
5. அனர்த்த முகாமைத்துவ அமைச்சின் செயலாளர்
6. சுகாதாரம், போசாக்கு மற்றும் சுதேச மருத்துவ அமைச்சின் செயலாளர்
7. மாகாண சபைகள் உள்ளூராட்சி அமைச்சின் செயலாளர்
8. தவிசாளர், தேசிய காப்புறுதி நம்பிக்கை நிதியம்
9. கணக்காய்வாளர் நாயகம்

(4–7: தொடர்புடைய அலுவலர்களுக்கு அறிவுறுத்தல்களை வழங்குவதற்காக)